# පොතලිය සුතතං

## පොතලිය සූත්‍රය

එවං මෙ සුතං එකං සමයං භගවා අඩගුතතරාපෙසු විහරති ආපණං නාම අඩගුතතරාපානං නිගමො. අථ බො භගවා පුබබනහසමයං නිවාසෙතවා පතතචීවරං ආදය ආපණං පිණඩාය පාවිසි. ආපණෙ පිණඩාය චරිතවා පචඡාභතතං පිණඩපාතපටිකකනෙතා යෙනඤඤතරො වනසණෙඩා තෙනුපඩකමි දිවාවිහාරාය. තං වනසණඩං අජෙඣාගහෙතවා අඤඤතරසමිං රුකඛමූලෙ දිවාවිහාරං නිසීදි.

මා විසින් මෙසේ අසන ලදී. එක් කාලෙක භාග්‍යවතුන් වහන්සේ අංගුත්තරාප නම් ජනපදයෙහි අංගුත්තරාප නම් දනව් වැස්සන්ගේ ආපණ නම් නියම් ගමෙහි වැඩ වාසය කරති. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු වේලෙහි හැඳපෙරවා පාසිවුරු ගෙන ආපණ නම් නියම් ගමට පිඬු පිණිස වැඩියහ. ආපණ නම් නියම් ගමෙහි පිඬු පිණිස හැසිර බතින් පසු කාලයෙහි පිණ්ඩපාතයෙන් වැලකුනේ එක්තරා වන ලැහැබක් යම් තැනෙක්හිද එතැනට දිවා විහරණය (දවල් විවේකය) පිණිස වැඩියහ. ඒ වන ලැහැබට ඇතුල්ව එක්තරා ගසක්මුල දිවා විහරණය සඳහා වැඩහුන්හ.

පොතලියොපි බො ගහපති සමපනනනිවාසනපාපුරණො ඡතතුපාහනාහි ජඩඝාවිහාරං අනුවිචරමානො අනුචඩකමමානො යෙන සො වනසණෙඩා තෙනුපසඩකමි. තං වනසණඩං අජෙඣාගහෙතවා යෙන භගවා තෙනුපසඩකමි. උපපසඩකමිතවා භගවතා සදධිං සමෙමාදි. සමෙමාදනීයං කථං සාරාණීයං. වීතිසාරෙතවා එකමනතං අටඨාසි. එකමනතං ඨිතං බො පොතලියං ගහපතිං භගවා එතදවොච: සංවිජජනෙත බො ගහපති ආසනානි සචෙ ආකඩඛසි නිසීදති. එවං වුතෙත පොතලියො ගහපති: ගහපතිවාදෙන මං සමණො ගොතමො සමුදචරතීති කුපිතො අනතතමනො තුණහී අහොසි. දුතියමපි බො භගවා පොතලියං ගහපතිං එතදවොච: සංවිජජනෙත බො ගහපති ආසනානි, සචෙ ආකඩඛසි නිසීදති. දුතියමපි බො පොතලියො ගහපති: ගහපතිවාදෙන මං සමණො ගොතමො සමුදචරතීති කුපිතො අනතතමනො තුණහී අහොසි. තතියමපි බො භගවා පොතලියං ගහපතිං එතදවොච: සංවිජජනෙත බො ගහපති ආසනානි, සචෙ ආකඩඛසි නිසීදති. එවං වුතෙත පොතලියො ගහපති: ගහපතිවාදෙන මං සමණො ගොතමො සමුදචරතීති කුපිතො අනතතමනො භගවනතං එතදවොච: තයිදං භො ගොතම නචඡනනං, තයිදං නපපතිරූපං, යං මං තවං ගහපති වාදෙන සමුදචරසීති.

පොතලි නම් ගෘහපති තෙමේ ද සම්පූර්ණ හැඳීම් පෙරවීම් ඇත්තේ කුඩයෙන් හා පාවහන් වලින් යුක්තව පා ගමනින් සක්මන් කරන්නේ ඒ වන ලැහැබ යම් තැනෙක්හිද එතැනට ගියේ ය. ඒ වන ලැහැබට ඇතුල්ව භාග්‍යවතුන් වහන්සේ යම් තැනක ද එතැනට පැමිණියේ ය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූයේ ය. සතුටු වියයුතු වූ සිහිකටයුතු වූ කථාව කොට නිමවා එක් පැත්තක සිටියේ ය. එක් පැත්තක සිටියාවූම පොතලිය ගෘහපතියාට භාග්‍යවතුන් වහන්සේ "ගෘහපතිය, ආසන ඇත්තාහ. ඉදින් කැමැත්තෙහි නම් ඉඳගනුව"යි කීහ. මෙසේ කී කල්හි පොතලිය ගෘහපති තෙම "මට ශ්‍රමණ ගෞතම තෙම ගෘහපති වාදයෙන් (ගෘහපතියා කීමෙන්) කථා කරයි" කියා කිපුනේ නොසතුටු සිත් ඇත්තේ නිශ්ශබ්ද වූයේ ය. දෙවනුව ද භාග්‍යවතුන් වහන්සේ පොතලිය ගෘහපතියාට මෙසේ කීහ. "ගෘහපතිය, ආසන ඇත්තාහ. ඉදින් කැමැත්තෙහි නම් ඉඳගනුව". දෙවනුව ද පොතලිය ගෘහපති තෙම "මට ශ්‍රමණ ගෞතම තෙම ගෘහපති වාදයෙන් කථා කරන්නේය"යි කිපුනේ නොසතුටු සිත් ඇත්තේ නිශ්ශබ්ද වූයේ ය. තුන්වෙනුව ද භාග්‍යවතුන් වහන්සේ පොතලිය ගෘහපතියාට මෙසේ කීහ. "ගෘහපතිය, ආසන ඇත්තාහ. ඉදින් කැමැත්තෙහි නම් ඉඳගනුව". මෙසේ කී කල්හි පොතලිය නම් ගෘහපති තෙම "මට ශ්‍රමණ ගෞතම තෙම ගෘහපති වාදයෙන් කථා කරන්නේය"යි කිපුනේ නොසතුටු සිත් ඇත්තේ භාග්‍යවතුන් වහන්සේට "භගවත් ගෞතමයන් වහන්ස, ඔබ වහන්සේ මට ගෘහපති වාදයෙන් කථා කෙරෙහිය යන යමක් වේ ද ඒ මේ කාරණය නුසුදුසුය, ඒ මේ කාරණය නො ගැලපේ"යයි කීය.

තෙ හි තෙ ගහපති ආකාරා තෙ ලිඞ්ගා තෙ නිමිත්තා යථා තං ගහපතිස්සාති. තථාහි පන මෙ භො ගොතම සබ්බෙ කම්මන්තා පටික්ඛිත්තා, සබ්බෙ වොහාරා සමුච්ඡින්නාති. යථා කථං පන තෙ ගහපති සබ්බෙ කම්මන්තා පටික්ඛිත්තා, සබ්බෙ වොහාරා සමුච්ඡින්නාති. ඉධ මෙ භො ගොතම යං අහොසි ධනං වා ධඤ්ඤං වා රජතං වා ජාතරූපං වා සබ්බං තං පුත්තානං දායජ්ජං නිය්‍යාතං, තත්‍ථාහං අනොවාදී අනුපවාදී ඝාසච්ඡාදනපරමො විහරාමි. එවං ඛො මෙ භො ගොතම සබ්බෙ කම්මන්තා පටික්ඛිත්තා සබ්බෙ වොහාරා සමුච්ඡින්නාති.

"ගෘහපතිය, තොපගේ ආකාරය ද, සටහන ද ලකුණු ද ගෘහපතියෙකුගේ මෙනි"

"භගවත් ගෞතමයන් වහන්ස, එසේ වුව ද මා විසින් සියලු කර්මාන්තයෝ අත්හරින ලද්දාහු ද? සියලු ව්‍යවහාරයෝ (වෙළහෙළඳම්) සිඳ දමන ලද්දහ".

"ගෘහපතිය, කෙසේ නම් තා විසින් සියලු කර්මාන්තයෝ අත්හරින ලද්දාහු ද? සියලු ව්‍යවහාරයෝ සිඳ දමන ලද්දාහු ද?".

" භගවත් ගෞතමයන් වහන්ස, මෙහි මාගේ ධනයක් හෝ ධාන්‍යයක් හෝ රිදී වූවක් හෝ රත්‍රන් වූවක් හෝ යමක් ඇද්ද ඒ සියල්ල පුත්‍රයන්ට දයාද කොට පාවාදෙන ලදී. එහි මම මෙසේ කරවයි, අවවාද නොකරන්නෙම් නම් මෙසේ නොකරවයි නැවත නොකියන්නෙම් නම් කෑම ඇඳීම ලැබීම පමණක් ඇත්තේ වාසය කරමි. භගවත් ගෞතමයන් වහන්ස, මෙසේ වනාහී මා විසින් සියලු කර්මාන්තයෝ අත්හැරීම කරන ලද්දහ. සියලු ව්‍යවහාරයෝ (වෙළහෙළඳම්) සිඳ දමන ලද්දහ"යි කීයේය.

අඤ්ඤථා ඛො ත්‍වං ගහපති වොහාරසමුච්ඡෙදං වදෙසි. අඤ්ඤථා ච පන අරියස්ස විනයෙ වොහාරසමුච්ඡෙදො හොතීති. යථා කථං පන භන්තෙ අරියස්ස විනයෙ වොහාරසමුච්ඡෙදො හොති. සාධු මෙ භන්තෙ භගවා තථා ධම්මං දෙසෙතු. යථා අරියස්ස විනයෙ වොහාරසමුච්ඡෙදො හොතීති. තෙන හි ගහපති සුණාහි සාධුකං මනසිකරොහි භාසිස්සාමීති. එවං භන්තෙති ඛො පොතලියො ගහපති භගවතො පච්චස්සොසි. භගවා එතදවොච:

"ගෘහපතිය, නුඹ කියන ව්‍යවහාර සිඳීම අනෙකකි. ආර්‍ය්‍ය විනයෙහි ව්‍යවහාර සිඳීම වෙන ආකාරයකින් වේ."

"ස්වාමීනි, කෙසේ නම් ආර්‍ය්‍ය විනයෙහි ව්‍යවහාරයන්ගේ සිඳීම වේ ද? ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ යම්සේ ආර්‍ය්‍ය විනයෙහි ව්‍යවහාරයන්ගේ සිඳීම වේ ද, මට එසේ ධර්මය දේශනා කරත්වා"යි (ඉල්ලා සිටියේ ය).

"ගෘහපතිය, එසේ නම් අසව, යහපත්කොට මෙනෙහි කරව. කියන්නෙමි"යි වදාළහ. "ස්වාමීනි, එසේ ය'යි කියා පොතලිය ගෘහපති තෙම භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ මෙය ප්‍රකාශ කළහ.

අට්ඨ ඛො ඉමෙ ගහපති ධම්මා අරියස්ස විනයෙ වොහාරසමුච්ඡෙදාය සංවත්තන්ති. කතමෙ අට්ඨ: අපාණාතිපාතං නිස්සාය පාණාතිපාතො පහාතබ්බො, දින්නාදානං නිස්සාය අදින්නාදානං පහාතබ්බං, සච්චං වාචං නිස්සාය මුසාවාදො පහාතබ්බො, අපිසුනං වාචං නිස්සාය පිසුනා වාචා පහාතබ්බා, අගිද්ධිලොභං නිස්සාය ගිද්ධිලොභො පහාතබ්බො, අනින්දාරොසං නිස්සාය නින්දාරොසො පහාතබ්බො, අකොධූපායාසං නිස්සාය කොධූපායාසො පහාතබ්බො, අනතිමානං නිස්සාය අතිමානො පහාතබ්බො. ඉමෙ ඛො ගහපති අට්ඨධම්මා සඞ්ඛිත්තෙන වුත්තා විත්ථාරෙන අවිභත්තා අරියස්ස විනයෙ වොහාරසමුච්ඡෙදාය සංවත්තන්තීති.

"ගෘහපතිය, මේ ධර්‍ම අටක් ආර්‍ය්‍ය විනයෙහි ව්‍යවහාර සිඳීම පිණිස පවතිත්. කවර අටක් ද යත්: සතුන් නොමැරීම නිසා සතුන් මැරීම දුරුකටයුතුය, දුන්දෙය ගැනීම නිසා නුදුන්දෙය ගැනීම දුරුකටයුතුය, ඇත්තකීම නිසා බොරුකීම දුරුකටයුතුය, කේලාම් නොකීම නිසා කේලාම්කීම දුරුකටයුතුය, ගිජුවීමයයි කියන ලද ලෝභය නොකිරීම නිසා ගිජුවීමයයි කියන ලද ලෝභය දුරුකටයුතුය, නින්දා කිරීමෙන් නොගැටීම නිසා නින්දා කිරීමෙන් ගැටීම දුරුකටයුතුය, ක්‍රෝධය වූ දැඩි වෙහෙස නොකිරීම නිසා ක්‍රෝධය වූ දැඩි වෙහෙස දුරුකටයුතුය, අධික මානය නොකිරීම නිසා අධික මානය දුරුකටයුතුය. ගෘහපතිය, සංක්‍ෂෙපයෙන් කියන ලද විස්තර වශයෙන් විභාග නොකරනලද මේ ධර්‍ම අට ආර්‍ය්‍ය විනයෙහි ව්‍යවහාර සිඳීම පිණිස පවතිත්" යයි වදාළහ.

යෙ මෙ භන්තෙ භගවතා අට්ඨ ධම්මා සඞ්ඛිත්තෙන වුත්තා විත්ථාරෙන අවිභත්තා අරියස්ස විනයෙ වොහාරසමුච්ඡෙදාය සංවත්තන්ති. සාධු මෙ භන්තෙ භගවා ඉමෙ අට්ඨ ධම්මෙ විත්ථාරෙන විභජතු අනුකම්පං උපාදායාති. තෙන හි ගහපති සුණාහි සාධුකං මනසිකරොහි භාසිස්සාමීති. එවං භන්තෙති ඛො පොතලියො ගහපති භගවතො පච්චස්සොසි. භගවා එතදවොච:

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ ධර්‍ම අටක් සංක්‍ෂෙපයෙන් කියන ලද්දාහු විස්තර වශයෙන් විභාග නොකරන ලද්දාහු ආර්‍ය්‍ය විනයෙහි ව්‍යවහාර සමුච්ඡෙදය පිණිස පවතිත් ද, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මේ ධර්‍ම අට මට අනුකම්පා පිණිස විස්තර වශයෙන් විභාග කෙරෙත්වා"යි කීයේ ය.

"ගෘහපතිය, එසේ වී නම් අසව, යහපත් කොට මෙනෙහි කරව, කියන්නෙමි"යි වදාළහ. "ස්වාමීනි, එසේය"යි කියා පොතලිය ගෘහපති තෙම භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ.

අපාණාතිපාතං නිස්සාය පාණාතිපාතො පහාතබ්බොති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඉධ ගහපති අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: යෙසං ඛො අහං සංයොජනානං හෙතු පාණාතිපාතී අස්සං, තෙසාහං සංයොජනානං පහානාය සමුච්ඡෙදාය පටිපන්නො; අහඤ්චෙව ඛො පන පාණාතිපාතී අස්සං අත්තාපි මං උපවදෙය්‍ය පාණාතිපාතපච්චයා, අනුවිච්ච විඤ්ඤූ ගරහෙය්‍යුං පාණාතිපාතපච්චයා, කායස්ස භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා පාණාතිපාතපච්චයා, එතදෙව ඛො පන සංයොජනං එතං නීවරණං යදිදං පාණාතිපාතො, යෙ ච පාණාතිපාතපච්චයා උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා, පාණාතිපාතා පටිවිරතස්ස එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. අපාණාතිපාතං නිස්සාය පාණාතිපාතො පහාතබ්බොති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

ප්‍රාණඝාත නොකිරීම නිසා ප්‍රාණඝාතය දුරුකටයුතු යයි. මෙසේ වනාහී මෙය කියන ලදී. කුමක් සඳහා මෙය කියන ලදද? ගෘහපතිය, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම මෙසේ සලකයි. යම් සංයෝජන කෙනෙකුන් ගේ හේතුවෙන් මම ප්‍රාණඝාත කරන්නෙක් වන්නෙම් ද ඒ සංයෝජනයන්ගේ දුරුකිරීම පිණිස, නැසීම පිණිස මම පිළිපන්නෙක් වෙමි. මම ද වනාහී ප්‍රාණඝාත කරන්නෙක් වන්නෙම් නම් තෙමේ ද තමහට ප්‍රාණඝාත කිරීම නිසා ගරහන්නේ ය. දැනගෙන නුවණැත්තෝ ද, ප්‍රාණඝාතය නිසා ගරහන්නාහුය. ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි ප්‍රාණඝාත හේතුවෙන් දුර්ගතිය ද කැමති විය යුත්තිය. යම් යම් ප්‍රාණඝාතයක් වේ ද, එයම සංයෝජනය වෙයි. එයම නීවරණය ද වෙයි, දුක් වූ දැවිලි ඇති යම් ආශ්‍රව කෙනෙකුන් ප්‍රාණඝාත හේතුවෙන් උපදින්නාහු ද, ප්‍රාණඝාතයෙන් වැළකුනා වූ මොහුට මෙසේ ඒ දුක් වූ දැවිලි ඇති ආශ්‍රවයෝ ද නොවෙත්. ප්‍රාණඝාත නොකිරීම නිසා ප්‍රාණඝාතය දුරුකටයුතුයි යන ඒ යමක් කියන ලද ද, එය මේ සඳහා කියන ලදී.

දින්නාදානං නිස්සාය අදින්නාදානං පහාතබ්බන්ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඉධ ගහපති අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: යෙසං ඛො අහං සංයොජනානං හෙතු අදින්නාදායී අස්සං, තෙසාහං සංයොජනානං පහානාය සමුච්ඡෙදාය පටිපන්නො අහඤ්චෙව ඛො පන අදින්නාදායී අස්සං, අත්තාපි මං උපවදෙය්‍ය අදින්නාදානපච්චයා. අනුවිච්ච විඤ්ඤූ ගරහෙය්‍යුං අදින්නාදානපච්චයා කායස්ස භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා අදින්නාදානපච්චයා. එතදෙව ඛො පන සංයොජනං එතං නීවරණං යදිදං අදින්නාදානං, යෙ ච අදින්නාදානපච්චයා උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා. අදින්නාදානා පටිවිරතස්ස එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. දින්නාදානං නිස්සාය අදින්නාදානං පහාතබ්බන්ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

දුන්දෙය ගැනීම නිසා නුදුන් දෙය ගැනීම දුරුකටයුතු යයි මෙසේ වනාහී මෙය කියන ලදී. කුමක් සඳහා මෙය කියන ලදද? ගෘහපතිය, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම මෙසේ සලකන්නේ ය. යම් සංයෝජන කෙනෙකුන් ගේ හේතුවෙන් මම නුදුන් දෙය ගන්නෙක් වන්නෙම් ද ඒ සංයෝජනයන්ගේ දුරුකිරීම පිණිස, නැසීම පිණිස පිළිපන්නෙක් වෙමි. මම ද වනාහි නුදුන් දෙය ගන්නෙක් වී නම් තමා ද තමහට නුදුන් දෙය ගැනීම නිසා ගරහන්නේ ය. නුදුන් දෙය ගැනීම නිසා නුවණැත්තෝ ද, දැනගෙන ගරහන්නාහුය. නුදුන් දෙය ගැනීම නිසා ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු දුර්ගතිය ද කැමතිවිය යුත්තිය. යම් මේ නුදුන් දෙය ගැනීමක් වේ ද එයම සංයෝජනය ද වේ. එයම නීවරණය ද වේ. නුදුන් දෙය ගැනීම නිසා දුක් වූ දැවිලි ඇති යම් ආශ්‍රව කෙනෙකුන් උපදින්නාහු ද, නුදුන් දෙය ගැනීමෙන් වැළකුනා වූ මොහුට මෙසේ දුක් වූ දැවිලි ඇති ආශ්‍රවයෝ ද නොවෙත්. නුදුන් දෙය ගැනීම නිසා නුදුන් දෙය ගැනීම දුරුකටයුතු යයි මෙසේ ඒ යමක් කියන ලද ද, එය මේ සඳහා කියන ලදී.

සච්චං වාචං නිස්සාය මුසාවාදෙ පහාතබ්බොති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඉධ ගහපති අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: යෙසං ඛො අහං සංයොජනානං හෙතු මුසාවාදී අස්සං, තෙසාහං සංයොජනානං පහානාය සමුච්ඡෙදාය පටිපන්නො. අහඤ්චෙව ඛො පන මුසාවාදී අස්සං, අත්තාපි මං උපවදෙය්‍ය මුසාවාදපච්චයා, අනුවිච්ච විඤ්ඤූ ගරහෙය්‍යුං මුසාවාදපච්චයා, කායස්ස භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා මුසාවාදපච්චයා. එතදෙව ඛො පන සංයොජනං එතං නීවරණං යදිදං මුසාවාදෙ, යෙ ච මුසාවාදපච්චයා උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා. මුසාවාද පටිවිරතස්ස එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. සච්චං වාචං නිස්සාය මුසාවාදෙ පහාතබ්බොති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

සත්‍ය වූ වචනය නිසා බොරුකීම දුරුකටයුතු යයි මෙසේ මෙය කියන ලදී. කුමක් සඳහා මෙය කියන ලදද? ගෘහපතිය, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම මෙසේ සලකන්නේ ය. මම වනාහි යම් සංයෝජන කෙනෙකුන් ගේ හේතුවෙන් බොරු කියන්නෙක් වන්නෙම් ද මම ඒ සංයෝජනයන්ගේ දුරුකිරීම පිණිස, නැසීම පිණිස පිළිපන්නෙක් වෙමි. මම ද වනාහි බොරු කියන්නෙක් වන්නෙම් නම් තමා ද තමහට බොරුකීම නිසා ගරහන්නේ ය. නුවණැත්තෝ ද, දැනගෙන බොරුකීම නිසා ගරහන්නාහුය. ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු බොරුකීම හේතුකොට දුගීතිය කැමතිවිය යුත්තිය. යම් මේ මුසාවාදයක් වේ ද එයම සංයෝජනය වේ. එයම නීවරණය ද වේ. මුසාවාද හේතුවෙන් දුක් වූ දැවිලි ඇති යම් ආශ්‍රව කෙනෙකුත් උපදින්නාහු ද, මුසාවාදයෙන් වැළකුනා වූ මොහුට මෙසේ ඒ දුක් වූ දැවිලි ඇති ආශ්‍රවයෝ ද නොවෙත්. සත්‍ය වූ වචනය නිසා මුසාවාදය දුරුකටයුතු යයි මෙසේ ඒ යමක් කියන ලද ද, එය මේ සඳහා කියන ලදී.

අපිසුනං වාචං නිස්සාය පිසුනා වාචා පහාතබ්බාති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඉධ ගහපති අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: යෙසං ඛො අහං සංයොජනානං හෙතු පිසුනාවාචො අස්සං, තෙසාහං සංයොජනානං පහානාය සමුච්ඡෙදාය පටිපන්නො. අහඤ්චෙව ඛො පන පිසුනාවාචො අස්සං, අත්තාපි මං උපවදෙය්‍ය පිසුනාවාචපච්චයා, අනුවිච්ච විඤ්ඤූ ගරහෙය්‍යුං පිසුනාවාචපච්චයා, කායස්ස භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා පිසුනාවාචපච්චයා. එතදෙව ඛො පන සංයොජනං එතං නීවරණං යදිදං පිසුනා වාචා, යෙ ච පිසුනාවාචපච්චයා උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා. පිසුනා වාචා පටිවිරතස්ස එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. අපිසුනං වාචං නිස්සාය පිසුනා වාචා පහාතබ්බාති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

කේලාම් නොකීම නිසා කේලාම් කීම දුරුකටයුතු යයි මෙසේ මෙය කියන ලදී. කුමක් සඳහා මෙය කියන ලදද? ගෘහපතිය, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම මෙසේ සලකන්නේ ය. මම වනාහි යම් සංයෝජන කෙනෙකුන් ගේ හේතුවෙන් කේලාම් කියන්නෙක් වන්නෙම් ද මම ඒ සංයෝජනයන්ගේ දුරුකිරීම පිණිස, නැසීම පිණිස පිළිපන්නේ වෙමි. මම ද වනාහි කේලාම් කියන්නෙක් වන්නෙම් නම් තමා ද තමහට කේලාම් කීම හේතුකොට ගරහන්නේ ය. නුවණැත්තෝ ද, දැනගෙන කේලාම්කීම හේතුකොට ගරහන්නාහුය. ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි කේලාම්කීම හේතුකොට දුගීතිය කැමතිවිය යුත්තිය. යම් මේ කේලාම්කීමක් වේ ද එයම සංයෝජනය වෙයි. එයම නීවරණය ද වේ කේලාම්කීම හේතුකොට දුක් වූ දැවිලි ඇති යම් ආශ්‍රව කෙනෙකුත් උපදින්නාහු ද, කේලාම්කීමෙන් වැළකුනා වූ මොහුට මෙසේ දුක් වූ දැවිලි ඇති ඒ ආශ්‍රවයෝ ද නොවෙත්. කේලාම් නොකීම නිසා කේලාම් කීම දුරුකටයුතු යයි මෙසේ ඒ යමක් කියන ලද ද, එය මේ සඳහා කියන ලදී.

අගිද්ධිලොභං නිස්සාය ගිද්ධිලොභො පහාතබ්බොති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඉධ ගහපති අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: යෙසං ඛො අහං සංයොජනානං හෙතු ගිද්ධිලොභී අස්සං, තෙසාහං සංයොජනානං පහානාය සමුච්ඡෙදාය පටිපන්නො අහඤ්චෙව ඛො පන ගිද්ධිලොභී අස්සං, අත්තාපි මං උපවදෙය්‍ය ගිද්ධිලොභපච්චයා, අනුවිච්ච විඤ්ඤූ ගරහෙය්‍යුං ගිද්ධිලොභපච්චයා, කායස්ස භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා ගිද්ධිලොභපච්චයා එතදෙව ඛො පන සංයොජනං එතං නීවරණං යදිදං ගිද්ධිලොභො, යෙ ච ගිද්ධිලොභපච්චයා උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා. අගිද්ධිලොභිස්ස එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. අගිද්ධිලොභං නිස්සාය ගිද්ධිලොභො පහාතබ්බොති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

ලෝභයෙන් ගිජු නොවීම නිසා ලෝභයෙන් ගිජුවීම දුරුකටයුතු යයි, මෙසේ මෙය කියන ලදී. කුමක් සඳහා මෙය කියන ලදද? ගෘහපතිය, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම මෙසේ සලකන්නේ ය. මම වනාහි යම් සංයෝජන කෙනෙකුන් ගේ හේතුවෙන් ලෝභයෙන් ගිජුවීම ඇත්තෙක් වන්නෙම් ද මම ඒ සංයෝජනයන්ගේ දුරුකිරීම පිණිස, නැසීම පිණිස පිළිපන්නේ වෙමි. මම ද වනාහි ලෝභයෙන් ගිජු වන්නෙම් නම් තමා ද තමහට ලෝභයෙන් ගිජුවීම නිසා ගරහන්නේ ය. නුවණැත්තෝ ද, දැනගෙන ලෝභයෙන් ගිජුවීම නිසා ගරහන්නාහුය. ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි ලෝභයෙන් ගිජුවීම නිසා දුර්ගතිය කැමතිවිය යුත්තිය. යම් මේ ලෝභයෙන් ගිජුවීමක් වේ ද එයම සංයෝජනය ද වේ. ලෝභයෙන් ගිජුවීම නිසා දුක් වූ දැවිලි ඇති යම් ආශ්‍රව කෙනෙකුන් උපදින්නාහු ද, ලෝභයෙන් ගිජුවීම නැත්තා වූ මොහුට මෙසේ දුක් වූ දැවිලි ඇති ඒ ආශ්‍රවයෝ ද නොවෙත්. ලෝභයෙන් ගිජු නොවීම නිසා ගිජුවන ලෝබය දුරුකටයුතු යයි මෙසේ ඒ යමක් කියන ලද ද, එය මේ සඳහා කියන ලදී.

අනින්දාරොසං නිස්සාය නින්දාරොසො පහාතබ්බොති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඉධ ගහපති අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: යෙසං ඛො අහං සංයොජනානං හෙතු නින්දාරොසී අස්සං, තෙසාහං සංයොජනානං පහානාය සමුච්ඡෙදාය පටිපන්නො. අහඤ්චෙව ඛො පන නින්දාරොසී අස්සං, අත්තාපි මං උපවදෙය්‍ය නින්දාරොසපච්චයා, අනුවිච්ච විඤ්ඤූ ගරහෙය්‍යුං නින්දාරොසපච්චයා, කායස්ස භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා නින්දාරොසපච්චයා. එතදෙව ඛො පන සංයොජනං එතං නීවරණං යදිදං නින්දාරොසො, යෙ ච නින්දාරොසපච්චයා උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා. අනින්දාරොසිස්ස එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. අනින්දාරොසං නිස්සාය නින්දාරොසො පහාතබ්බොති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

නින්දා නොකිරීම හා නොකිපීම නිසා නින්දා කිරීම හා කිපීම දුරුකටයුතු යයි, මෙසේ මෙය කියන ලදී. කුමක් සඳහා මෙය කියන ලදද? ගෘහපතිය, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම මෙසේ සලකයි. මම වනාහි යම් සංයෝජන කෙනෙකුන් ගේ හේතුවෙන් නින්දා කිරීම හා කිපීම ඇත්තෙක් වන්නෙම් ද මම ඒ සංයෝජනයන්ගේ දුරුකිරීම පිණිස, නැසීම පිණිස පිළිපන්නේ වෙමි. මම ද වනාහි නින්දා කිරීම හා කිපීම ඇත්තෙක් වන්නෙම් නම් තෙමේ ද තමහට ගරහන්නේ ය. නුවණැත්තෝ ද, දැනගෙන නින්දා කිරීම හා කිපීම නිසා ගරහන්නාහුය. ශරීරයාගේ භේදයෙන් මරණින් මත්තෙහි නින්දා කිරීම හා කිපීම නිසා දුර්ගතිය කැමතිවිය යුත්තිය. යම් මේ නින්දා කිරීම හා කිපීමක් වේ ද මෙයම සංයෝජනය වේ. මෙයම නීවරණය ද වේ. නින්දා කිරීම හා කිපීම නිසා දුක් වූ දැවිලි ඇති යම් ආශ්‍රව කෙනෙකුන් උපදින්නාහු ද, නින්දා කිරීම හා කිපීම නැත්තා වූ මොහුට මෙසේ දුක් වූ දැවිලි ඇති ඒ ආශ්‍රවයෝ නොවෙත්. නින්දා නොකිරීම හා නොකිපීම නිසා නින්දා කිරීම හා කිපීම දුරුකටයුතු යයි මෙසේ යමක් කියන ලද ද, එය මේ සඳහා කියන ලදී.

අකොධූපායාසං නිස්සාය කොධූපායාසො පහාතබ්බොති ඉති බො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඉධ ගහපති අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: යෙසං බො අහං සංයොජනානං හෙතු කොධූපායාසී අස්සං, තෙසාහං සංයොජනානං පහානාය සමුච්ඡෙදාය පටිපන්නො. අහඤ්චෙව බො පන කොධූපායාසී අස්සං, අත්තාපි මං උපවදෙය්‍ය කොධූපායාසපච්චයා, අනුවිච්ච විඤ්ඤූ ගරහෙය්‍යුං කොධූපායාසපච්චයා, කායස්ස භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා කොධූපායාසපච්චයා. එතදෙව බො පන සංයොජනං එතං නීවරණං යදිදං කොධූපායාසො, යෙ ච කොධූපායාසපච්චයා උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා. කොධූපායාසිස්ස එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. අකොධූපායාසං නිස්සාය කොධූපායාසො පහාතබ්බොති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

දැඩි ක්‍රෝධ නොකිරීමෙන් දැඩි ක්‍රෝධ කිරීම දුරුකටයුතු යයි, මෙසේ මෙය කියන ලදී. කුමක් සඳහා මෙය කියන ලදද? ගෘහපතිය, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම මෙසේ සලකයි. මම වනාහි යම් සංයෝජන කෙනෙකුන් ගේ හේතුවෙන් දැඩි ක්‍රෝධ ඇත්තෙක් වන්නෙම් නම් මම ඒ සංයෝජනයන්ගේ දුරුකිරීම පිණිස, නැසීම පිණිස පිළිපන්නේ වෙමි. මම ද වනාහි දැඩි ක්‍රෝධ ඇත්තෙක් වන්නෙම් නම් තෙමේ ද තමහට දැඩි ක්‍රෝධය නිසා ගරහන්නේ ය. නුවණැත්තෝ ද, දැනගෙන දැඩි ක්‍රෝධය නිසා ගර්හා කරන්නාහුය. ශරීරයාගේ භේදයෙන් මරණින් මත්තෙහි දැඩි ක්‍රෝධය නිසා දුගීතිය කැමතිවිය යුත්තිය. යම් මේ දැඩි ක්‍රෝධයක් වේ ද මෙයම සංයෝජනය වේ. මෙයම නීවරණය ද වේ. දැඩි ක්‍රෝධය නිසා දුක් වූ දැවිලි ඇති යම් ආශ්‍රව කෙනෙකුන් උපදින්නාහු ද, දැඩි ක්‍රෝධය නැත්තා වූ මොහුට මෙසේ දුක් වූ දැවිලි ඇති ඒ ආශ්‍රවයෝ ද නොවෙත්. දැඩි ක්‍රෝධය නොකිරීම නිසා දැඩි ක්‍රෝධය දුරුකටයුතු යයි මෙසේ ඒ යමක් කියන ලද ද, එය මේ සඳහා කියන ලදී.

අනතිමානං නිස්සාය අතිමානො පහාතබ්බොති ඉති බො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඉධ ගහපති අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: යෙසං බො අහං සංයොජනානං හෙතු අතිමානී අස්සං, තෙසාහං සංයොජනානං පහානාය සමුච්ඡෙදාය පටිපන්නො. අහඤ්චෙව බො පන අතිමානී අස්සං, අත්තාපි මං උපවදෙය්‍ය අතිමානපච්චයා, අනුවිච්ච විඤ්ඤූ ගරහෙය්‍යුං අතිමානපච්චයා, කායස්ස භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා අතිමානපච්චයා. එතදෙව බො පන සංයොජනං එතං නීවරණං යදිදං අතිමානො, යෙ ච අතිමානපච්චයා උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා. අනතිමානිස්ස එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. අනතිමානං නිස්සාය අතිමානො පහාතබ්බොති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

අධික මානය නොකිරීම නිසා අධික මානය දුරුකටයුත්තේ යයි, මෙසේ මෙය කියන ලදී. කුමක් සඳහා මෙය කියන ලදද? ගෘහපතිය, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම මෙසේ සලකයි. මම වනාහි යම් සංයෝජන කෙනෙකුන් ගේ හේතුවෙන් අධික මානය ඇත්තෙක් වන්නෙම් ද මම ඒ සංයෝජනයන්ගේ දුරුකිරීම පිණිස, නැසීම පිණිස පිළිපන්නේ වෙමි. මම ද වනාහි අධික මානය ඇත්තෙක් වන්නෙම් නම් තෙමේ ද තමහට අධික මානය හේතුවෙන් ගරහන්නේ ය. නුවණැත්තෝ ද, දැනගෙන අධික මානය හේතුවෙන් ගරහන්නාහුය. ශරීරයාගේ භේදයෙන් මරණින් මත්තෙහි අධික මාන හේතුවෙන් දුගීතිය කැමතිවිය යුත්තිය. යම් මේ අධික මානයක් වේ ද එයම සංයෝජනය වේ. එයම නීවරණය ද වේ. අධික මාන හේතුවෙන් දුක් වූ දැවිලි ඇති යම් ආශ්‍රව කෙනෙකුන් උපදින්නාහු ද, අධික මානය නැත්තා වූ මොහුට මෙසේ දුක් වූ දැවිලි ඇති ඒ ආශ්‍රවයෝ ද නොවෙත්. අධික මානය නොකිරීම නිසා අධික මානය දුරුකටයුතු යයි මෙසේ ඒ යමක් කියන ලද ද, එය මේ සඳහා කියන ලදී.

ඉමෙ බො ගහපති අටඨ ධමමා සඞ්ඛිතෙතන වුතතා විතථාරෙන විභතතා යෙ අරියසස විනයෙ වොහාරසමුචෙඡදය සංවතතනති. න තෙවව තාව අරියසස විනයෙ සබෙබන සබබං සබබථා සබබං වොහාරසමුචෙඡදො හොතීති. යථා කථං පන භනෙත අරියසස විනයෙ සබෙබන සබබං සබබථා සබබං වොහාරසමුචෙඡදො හොති. සාධු මෙ භනෙත භගවා තථා ධමමං දෙසෙතු යථා අරියසස විනයෙ සබෙබන සබබං සබබථා සබබං වොහාරසමුචෙඡදො හොතීති. තෙන හි ගහගපති සුණාහි. සාධුකං මනසිකරොහි. භාසිසසාමීති. එවං භනෙතති බො පොතලියො ගහපති භගවතො පචචසොසි. භගවා එතදවොච:

"ගෘහපතිය, ආර්‍ය්‍ය විනයෙහි යම් ධර්‍ම කෙනෙක් ව්‍යවහාර සමුච්ඡේදය පිණිස පවතිත් ද, සංක්‍ෂෙපයෙන් කියන ලද්ද වූ මේ ධර්‍ම අට විස්තර වශයෙන් විභාග කරන ලදහ. එපමණකින්ම ආර්‍ය්‍ය විනයෙහි සර්‍වප්‍රකාරයෙන් සියල්ල සියලු ආකාරයෙන් ව්‍යවහාරයන්ගේ සිඳීම නොවේමය"යි වදාළහ.

"ස්වාමීනි, කෙසේ නම් ආර්‍ය්‍ය විනයෙහි සර්‍වප්‍රකාරයෙන් සියලු ආකාරයෙන් ව්‍යවහාරයන් ගේ සිඳීම වේ ද, ස්වාමීනි, යම්සේ ආර්‍ය්‍ය විනයෙහි සර්‍වප්‍රකාරයෙන් සියලු ආකාරයෙන් ව්‍යවහාර සමුච්ඡේදය වේ ද, භාග්‍යවතුන් වහන්සේ මට එසේ ධර්‍මය දේශනා කෙරේවා"යි කීය. "ගෘහපතිය, එසේ වී නම් අසව, යහපත්කොට මෙනෙහි කරව, කියන්නෙමි"යි වදාළහ. "ස්වාමීනි, එසේ ය"යි පොතලිය ගෘහපති තෙම භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ.

සෙය්‍යථාපි ගහපති කුකකුරො ජිඝචඡාදුබබල්‍යපරෙතො ගොඝාතකසූණං පචචුපටඨිතො අසස. තමෙනං දකෙඛා ගොඝාතකො වා ගොඝාතකනෙතවාසී වා අටඨිකඞකලං සුනිකකනතනිකකනතං නිමමංසං ලොහිතමකඛිතං උපචඡුභෙය්‍ය. තං කිමමඤඤසි ගහපති: අපි නු සො කුකකුරො අමුං අටඨිකඞකලං සුනිකකනතනිකකනතං නිමමංසං ලොහිතමකඛිතං පලිබාදෙනෙතා ජිඝචඡාදුබබල්‍යං පටිවිනෙය්‍යාති. නො හෙතං භනෙත, තං කිසස හෙතු: අදුං හි භනෙත අටඨිකඞකලං සුනිකකනතනිකකනතං නිමමංසං ලොහිතමකඛිතං, යාවදෙව ච පන සො කුකකුරො කිලමථසස විඝාතසස භාගී අසසාති. එවමෙව බො ගහපති අරියසාවකො ඉති පටිසඤචිකඛති. අටඨිකඞකලූපමා කාමා වුතතා භගවතා බහුදුකඛා බහූපායාසා, ආදීනවො එතථ භිය්‍යොති. එවමෙතං යථා භූතං සමමපපඤඤාය දිසවා යායං උපෙකඛා නානතතා නානතතසිතා, තං අභිනිවජෙජතවා යායං උපෙකඛා එකතතා එකතත සිතා, යතථ සබබසො ලොකාමිසූපාදනා අපරිසෙසා නිරුජඣනති. තමෙවූපෙකඛං භාවෙති.

"ගෘහපතිය, යම් සේ බඩසා දුබල බැවින් පෙලුනාවූ බල්ලෙක් ගවයන් මරණ මස් ලොඹුවක් ලඟට ගොස් සිටියේ වේ ද, ඌට දක්‍ෂ වූ ගවයන් මරන්නෙක් හෝ ගවයන් මරන්නෙකුගේ අතවැසියෙක් හෝ මොනවට කපන ලද මස් නැති, ලේ තැවරුනු ඇට කැබැල්ලක් ලඟට දමන්නේය, ගෘහපතිය, ඒ කුමකැයි හඟින්නෙහි ද? ඒ බල්ලා මොනවට කපන ලද මස් නැති, ලේ තැවරුනු ඒ ඇට කටුව ලෙවකන්නේ බඩගින්නෙන් වූ දුර්වලකම දුරුකරන්නේ ද"යි (ඇසූහ.)

"ස්වාමීනි, එය නොවේමය."

"එයට හේතු කවරේ ද?"

"ස්වාමීනි, ඒ ඇටකටුව වනාහී මොනවට කපන ලද්ද වූ මස් නැති ලේ තැවරුණක් වෙයි. ඒ බල්ලා වනාහී ඉතා වැඩියක්ම වෙහෙසීමට දුකට කොටස්කාරයෙක් වන්නේය"යි (කීය).

ගෘහපතිය, එපරිද්දෙන්ම ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම මෙසේ සලකයි. කාමයෝ ඇට සැකිල්ලකට බඳු උපමා ඇත්තාහුය. බොහෝ දුක් ඇත්තාහුය. බොහෝ වෙහෙස ඇත්තාහුය. මෙහි ආදීනව බොහෝ යයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලදහ. මෙසේ මෙය ඇති සැටියෙන් මනා නුවණින් දැක නා නා ස්වභාව ඇත්තා වූ නා නා ස්වභාව ඇසුරු කළා වූ යම් මේ (පඤ්චකාම ගුණයන්හි වූ) උපෙක්‍ෂාවක් වේ ද එය දුරුකොට ඒක ස්වභාව ඇත්තා වූ ඒකත්වය ඇසුරු කළා වූ යම් මේ (චතුර්‍ථධ්‍යානයෙන් වූ) උපෙක්‍ෂාවක් වේ ද, යම් තැනෙක්හි සියලු ආකාරයෙන් ලෝකාමිසයයි කියන ලද පඤ්චකාම ගුණයන් දැඩිව අල්වා ගැනීම් ඉතිරි නැතිව නැතිවෙත් ද ඒ උපෙක්‍ෂාවම වඩයි.

සෙය්‍යථාපි ගහපති ගිජ්ඣො වා කඞ්කො වා කුලලො වා මංසපෙසිං ආදය උඩ්ඩීයෙය්‍ය, තමෙනං ගිජ්ඣාපි කඞ්කාපි කුලලාපි අනුපතිත්වා අනුපතිත්වා විතච්ඡෙය්‍යුං විරාජෙය්‍යුං තං කිම්මඤ්ඤසි ගහපති, සචෙ සො ගිජ්ඣො වා කඞ්කො වා කුලලො වා තං මංසපෙසිං න ඛිප්පමෙව පටිනිස්සජ්ජෙය්‍ය. සො තතො නිදානං මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛන්ති. එවං භන්තෙ, එවමෙව ඛො ගහපති අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: මංසපෙසූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහූපායාසා, ආදීනවො එත්ථ භිය්‍යොති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා යායං උපෙක්ඛා නානත්තා නානත්තසිතා, තං අභිනිවජ්ජෙත්වා යායං උපෙක්ඛා එකත්තා එකත්තසිතා, යත්ථ සබ්බසො ලොකාමිසූපාදනා අපරිසෙසා නිරුජ්ඣන්ති. තමෙවූපෙක්ඛං භාවෙති.

"ගෘහපති, යම් සේ ගිජුලිහිණියෙක් හෝ ලෝ තුඩුවෙක් හෝ උකුස්සෙක් හෝ මස් පිඩක් ගෙන පියාඹන්නේ ද ඌ ගිජුලිහිණියෝ ද ලෝ තුඩුවෝ ද උකුස්සෝ ද ලුහුබඳිමින් මුව තුඩින් ඇන ඇන යන්නාහු ද මස් පිඩ ඇද බිම හෙලන්නාහු ද ගෘහපතිය, එය කුමකැයි හඟින්නෙහි ද? ඉදින් ඒ ගිජුලිහිණියා හෝ ලෝ තුඩුවා හෝ උකුස්සා හෝ මස් පිඩ වහාම නො දමන්නේ නම් හෙතෙම ඒ හේතුවෙන් මරණයට හෝ පැමිණෙන්නේ ද? මරණය සමාන දුකට හෝ පැමිණෙන්නේද"යි (ඇසූහ.)

"ස්වාමීනි, එසේ ය."

ගෘහපතිය, එපරිද්දෙන්ම ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම මෙසේ සලකයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මස් පිඩකට බඳු වූ කාමයෝ බොහෝ දුක් ඇත්තාහුය. බොහෝ වෙහෙස ඇත්තාහුය. මෙහි ආදීනව බොහෝ යයි වදාරණ ලද්දාහුය. මෙසේ මෙය ඇතිසැටියෙන් යහපත් නුවණින් දැක යම් මේ නොයෙක් ස්වභාව ඇති නා නාත්වය ඇසුරු කළා වූ උපේක්ෂාවක් වේ ද එය දුරුකොට යම් මේ ඒකත්වය ඇත්තා වූ ඇසුරු කළා වූ උපේක්ෂාවක් වේ ද යම් තැනෙක සියලු ආකාරයෙන් ලෝකාමිසයන් දැඩිකොට ගැනීම ඉතිරි නැතිව නැතිවේ ද ඒ උපේක්ෂාවම වඩයි.

සෙය්‍යථාපි ගහපති පුරිසො ආදිත්තං තිණුක්කං ආදය පටිවාතං ගච්ඡෙය්‍ය. තං කිම්මඤ්ඤසි ගහපති, සචෙ සො පුරිසො තං ආදිත්තං තිණුක්කං න ඛිප්පමෙව පටිනිස්සජ්ජෙය්‍ය. තස්ස සා ආදිත්තා තිණුක්කා හත්ථං වා දහෙය්‍ය බාහං වා දහෙය්‍ය. අඤ්ඤතරං වා අඞ්ගපච්චඞ්ගං දහෙය්‍ය. සො තතො නිදානං මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛන්ති. එවං භන්තෙ, එවමෙව ඛො ගහපති අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: තිණුක්කූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහූපායාසා, ආදීනවො එත්ථ භිය්‍යොති එවමෙතං යථා භූතං සම්මප්පඤ්ඤාය දිස්වා යායං උපෙක්ඛා නානත්තා නානත්තසිතා, තං අභිනිවජ්ජෙත්වා යායං උපෙක්ඛා එකත්තා එකත්තසිතා, යත්ථ සබ්බසො ලොකාමිසූපාදනා අපරිසෙසා නිරුජ්ඣන්ති. තමෙවූපෙක්ඛං භාවෙති.

"ගෘහපති, යම් සේ පුරුෂයෙක් තෙම ඇවුලුනා වූ තණසුලක් ගෙන උඩුසුලඟට යන්නේ ද, ගෘහපතිය, එය කුමකැයි හඟින්නෙහි ද? ඉදින් ඒ පුරුෂ තෙම ඇවිලගත් තණසුල ඔහුගේ අත හෝ දවන්නේ ය. බාහුව හෝ දවන්නේ ය. වෙනයම් අවයවයක් හෝ දවන්නේ ය. හෙතෙම ඒ හේතුවෙන් මරණයට හෝ මරණය තරම් දුකට හෝ පැමිණෙන්නේ නො වේද?"

"ස්වාමීනි, එසේය."

ගෘහපතිය, මෙපරිද්දෙන්ම ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම මෙසේ සලකයි. භාග්‍යවතුන් වහන්සේ විසින් තණසුලකට බඳු වූ කාමයෝ බොහෝ දුක් ඇත්තාහුය. බොහෝ වෙහෙස ඇත්තාහුය. මෙහි බොහෝ ආදීනව ඇත්තේ යයි වදාරණ ලද්දාහුය. මෙසේ මෙය ඇතිසැටියෙන් යහපත් නුවණින් දැක යම් මේ නොයෙක් ස්වභාව ඇති නානාත්වය ඇසුරු කළා වූ උපේක්ෂාවක් වේ ද එය දුරුකොට යම් මේ ඒකත්වය ඇත්තා වූ ඒකත්වය ඇසුරු කළා වූ උපේක්ෂාවක් වේ ද යම් තැනෙක සියලු ආකාරයෙන් ලෝකාමිසයන් දැඩිකොට ගැනීම ඉතිරි නැතිව නැතිවෙත් ද ඒ උපේක්ෂාවම වඩයි.

සෙය්‍යථාපි ගහපති අඞගාරකාසු සාධිකපොරිසා පූරා අඞගාරානං වීතච්චිකානං වීතධූමානං, අථ පුරිසො ආගචඡෙය්‍ය ජීවිතුකාමො අමරිතුකාමො සුඛකාමො දුකඛපටිකකූලො. තමෙනං දෙව බලවනතො පුරිසා නානාබාහාසු ගහෙත්වා අඞගාරකාසුං උපකඩඪෙය්‍යුං. තං කිමමඤඤසි ගහපති, අපි නු සො පුරිසො ඉතිචීතිචෙව කායං සනනාමෙය්‍යාති, එවං භනතෙ තං කිසස හෙතු: විදිතං හි භනතෙ තසස පුරිසසස ඉමඤචාහං අඞගාරකාසුං පතිසසාමි. තතො නිදනං මරණං වා නිගචඡාමි මරණමතතං වා දුකඛනති. එවමෙව බො ගහපති අරියසාවකො ඉති පටිසඤචිකඛති: අඞගාරකාසූපමා කාමා වුතතා භගවතා බහුදුකඛා බහූපායාසා, ආදීනවො එත්ථ භියය්‍යොති එවමෙතං යථාභූතං සමමපපඤඤාය දිසවා යායං උපෙකඛා නානතතා නානතතසිතා, තං අභිනිවජජෙත්වා යායං උපෙකඛා එකතතා එකතතසිතා, යත්ථ සබබසො ලොකාමිසූපාදනා අපරිසෙසා නිරුජඣනති. තමෙවූපෙකඛං භාවෙති.

"ගෘහපතිය, යම් සේ මිනිස් උසකට වඩා ගැඹුරු වූ පහව ගිය ගිනිදැල් ඇති පහවූ දුම් ඇති අඟුරුවලින් පිරුනා වූ අඟුරු වලක් වේ ද ඉක්බිති ජීවත්වනු කැමැත්තා වූ නොමැරෙනු කැමැත්තා වූ සැප කැමැත්තා වූ දුක් පිළිකුල් කරන්නා වූ පුරුෂයෙක් එන්නේ ය. ඔහු ශක්තිමත් වූ පුරුෂයෝ දෙදෙනෙක් වෙන වෙන අත්වලින් ගෙන අඟුරු වලට ඇද දමන්නාහුය. ගෘහපතිය, ඒ කුමකැයි හඟින්නෙහි ද? ඒ පුරුෂ තෙම ඒ මේ අතට ශරීරය නමන්නේ නොවේ ද?"

"ස්වාමීනි, එසේය."

"එයට හේතු කවරේ ද?"

"ස්වාමීනි, ඉදින් මම මේ අඟුරු වළට වැටෙන්නෙම් නම් ඒ හේතුවෙන් මරණයට හෝ මැරෙන තරම් දුකට හෝ පැමිණෙන්නේ ය යනු ඒ පුරුෂයාහට පැහැදිලිමය."

ගෘහපතිය, මෙපරිද්දෙන්ම ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම මෙසේ සලකයි. භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ අඟුරු වළක් බඳුය. බොහෝ දුක් ඇත්තාහුය, බොහෝ වෙහෙස ඇත්තාහුය. මෙහි බොහෝ ආදීනව ඇත්තේයි වදාරණ ලද්දාහුය. මෙසේ මෙය ඇතිසැටියෙන් මනාව නුවණින් දැක යම් මේ නොයෙක් ස්වභාව ඇති නානාත්වය ඇසුරු කළා වූ උපේක්ෂාවක් වේ ද එය දුරුකොට යම් මේ ඒකත්වය ඇත්තා වූ ඒකත්වය ඇසුරු කළා වූ උපේක්ෂාවක් වේ ද යම් තැනෙක සියලු ආකාරයෙන් ලෝකාමිසයන් දැඩිකොට ගැනීම ඉතිරි නැතිව නැතිවේ ද ඒ උපේක්ෂාවම වඩයි.

සෙය්‍යථාපි ගහපති පුරිසො සුපිනකං පසසෙය්‍ය ආරාමරාමණෙය්‍යකං වනරාමණෙය්‍යකං භූමිරාමණෙය්‍යකං පොකඛරණීරාමණෙය්‍යකං සො පටිබුදධො න කිඤචි පසසෙය්‍ය, එවමෙව බො ගහපති අරියසාවකො ඉති පටිසඤචිකඛති: සුපිනකූපමා කාමා වුතතා භගවතා බහුදුකඛා බහූපායාසා, ආදීනවො එත්ථ භියය්‍යොති එවමෙතං යථා භූතං සමමපපඤඤාය දිසවා යායං උපෙකඛා නානතතා නානතතසිතා, තං අභිනිවජජෙත්වා යායං උපෙකඛා එකතතා එකතතසිතා, යත්ථ සබබසො ලොකාමිසූපාදනා අපරිසෙසා නිරුජඣනති. තමෙවූපෙකඛං භාවෙති.

ගෘහපතිය, යම් සේ පුරුෂයෙක් තෙම ආරාමයන්ගෙන් සිත්කලු බැව් ඇති, වනයන්ගෙන් සිත්කලු බැව් ඇති, භූමින්ගෙන් සිත්කලු බැව් ඇති, පොකුණු වලින් සිත්කලු බැව් ඇති, සිහිනයක් දක්නේ ද හෙතෙම පිබිදියේ කිසිවක් නො දක්නේ ය. ගෘහපතිය, එපරිද්දෙන්ම ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම මෙසේ සලකයි. සිහිනයකට බඳු වූ කාමයෝ බොහෝ දුක් ඇත්තාහුය, බොහෝ වෙහෙස ඇත්තාහුය, මෙහි බොහෝ ආදීනව ඇත්තේ යයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දාහුය. මෙය ඇතිසැටියෙන් මනා නුවණින් දැක යම් මේ නොයෙක් ස්වභාව ඇති නානාත්වය ඇසුරු කළා වූ උපේක්ෂාවක් වේ ද එය දුරුකොට යම් මේ ඒකත්වය ඇත්තා වූ ඒකත්වය ඇසුරු කළා වූ උපේක්ෂාවක් වේ ද යම් තැනෙක සියලු ආකාරයෙන් ලෝකාමිසයන් දැඩිකොට ගැනීම ඉතිරි නැතිව නැතිවේ ද ඒ උපේක්ෂාවම වඩයි.

සෙය්‍යථාපි ගහපති පුරිසො යාචිතකං භොගං යාචිත්වා යානං වා පොරොසෙය්‍යං පවරමණිකුණ්ඩලං, සො තෙහි යාචිතකෙහි භොගෙහි පුරක්ඛතො පරිවුතො අන්තරාපණං පටිපජ්ජෙය්‍ය. තමෙනං ජනො දිස්වා එවං වදෙය්‍ය: භොගී වත භො පුරිසො, එවං කිර භොගිනො භොගානි භුඤ්ජන්තීති. තමෙනං සාමිකා යත්ථ යත්ථෙව පස්සෙය්‍යුං තත්ථ තත්ථෙව සානි හරෙය්‍යුං. තං කිම්මඤ්ඤසි ගහපති, අලන්නු බො තස්ස පුරිසස්ස අඤ්ඤථත්තායාති. එවං භන්තෙ, තං කිස්ස හෙතු: සාමිනො හි භන්තෙ සානි අරහන්තීති. එවමෙව බො ගහපති අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: යාචිතකූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහූපායාසා, ආදීනවො එත්ථ භිය්‍යොති එවමෙතං යථා භූතං සම්මප්පඤ්ඤාය දිස්වා යායං උපෙක්ඛා නානත්තා නානත්තසිතා, තං අභිනිවජ්ජෙත්වා යායං උපෙක්ඛා එකත්තා එකත්තසිතා, යත්ථ සබ්බසො ලොකාමිසූපාදානා අපරිසෙසා නිරුජ්ඣන්ති. තමෙවූපෙක්ඛං භාවෙති.

ගෘහපතිය, යම් සේ පුරුෂයෙක් තෙම පුරුෂයන්ට සුදුසු වූ යානාවක් හෝ උතුම් මිණි කොඩොලක් හෝ ඉල්වාගතයුතු භෝගයක් වේ ද හෙතෙම ඒ ඉල්වාගන්නා ලද භෝගයන්ගෙන් සැරසුනේ පිරිවරන ලද්දේ කඩපිලකට පැමිණෙන්නේය. ඔහු දැක ජනයා "මේ පින්වත් පුරුෂ තෙම ඒකාන්තයෙන් භෝග (සම්පත්) ඇත්තෙක, මෙසේ වනාහී සම්පත් ඇත්තෝ සම්පත් අනුභව කෙරෙත්" යයි කියන්නේ ය. වස්තු හිමියෝ යම් යම් තැනෙක්හිම ඔහු දක්නාහු ද ඒ ඒ තන්හිම ස්වකීය භාණ්ඩයන් හැරගන්නහුය. ගෘහපතිය, ඒ කුමකැයි හැඟින්නේ ද? ඒ පුරුෂයාගේ හිත නරක්වීමට ඒ ප්‍රමාණවත් යයි සිතන්නෙහි ද?

"ස්වාමීනි, එය එසේ ය."

"එයට හේතු කවරේ ද?"

"ස්වාමීනි, බඩුහිමියෝ වනාහී තම තමන්ගේ බඩු හැරගනිති"

ගෘහපතිය, මෙපරිද්දෙන්ම ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම මෙසේ සලකයි. ඉල්වාගන්නා ලද බඩු වැනි වූ කාමයෝ බොහෝ දුක් ඇත්තාහුය, බොහෝ වෙහෙස ඇත්තාහුය. මෙහි බොහෝ ආදීනව ඇත්තේ යයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දහුය. මෙසේ මෙය ඇතිසැටියෙන් මනා නුවණින් දැක යම් මේ නොයෙක් ස්වභාව ඇති නානාත්වය ඇසුරු කළා වූ උපේක්ෂාවක් වේ ද එය දුරුකොට යම් මේ ඒකත්වය ඇත්තා වූ ඒකත්වය ඇසුරු කළා වූ උපේක්ෂාවක් වේ ද යම් තැනෙක සියලු ආකාරයෙන් ලෝකාමිසයන් දැඩිකොට ගැනීම් ඉතිරි නැතිව නැතිවේ ද ඒ උපේක්ෂාවම වඩයි.

සෙය්‍යාථාපි ගහපති ගාමසස වා නිගමසස වා අවිදූරෙ තිබෙබා වනසණෙඩා, තත්‍රසස රුකෙඛා සමපනනඵලො ච උපපනනඵලො ච, න චසසු කානිචි ඵලානි භූමියං පතිතානි, අථ පුරිසො ආගචෙඡය්‍ය ඵලත්ථිකො ඵලගවෙසී ඵලපරියෙසනං චරමානො, සො තං වනසණඩං අජෙඣාගහෙත්වා තං රුකඛං පසෙසය්‍ය සමපනනඵලඤච උපපනනඵලඤච, නත්ථි ච කානිචි ඵලානි භූමියං පතිතානි, ජානාමි ඛො පනාහං රුකඛං ආරුහිතුං යනනූනාහං ඉමං රුකඛං ආරුහිත්වා යාවදත්ථඤච ඛාදෙය්‍යං උචඡඞගඤච පූරෙය්‍යනති. සො තං රුකඛං ආරුහිත්වා යාවදත්ථඤච ඛාදෙය්‍ය උචඡඞගඤච පූරෙය්‍ය. අථ දුතියො පුරිසො ආගචෙඡය්‍ය ඵලත්ථිකො ඵලගවෙසී ඵලපරියෙසනං චරමානො තිණහං කුඨාරිං ආදය, සො තං වනසණඩං අජෙඣාගහෙත්වා තං රුකඛං පසෙසය්‍ය සමපනනඵලඤච උපපනනඵලඤච තසස එවමසස: අයං ඛො රුකෙඛා සමපනනඵලො ච උපපනනඵලො ච, නත්ථි ච කානිචි ඵලානි භූමියං පතිතානි න ඛො පනාහං ජානාමි රුකඛං ආරුහිතුං, යනනූනාහං ඉමං රුකඛං මූලතො ඡෙත්වා යාවදත්ථඤච ඛාදෙය්‍යං උචඡඞගඤච පූරෙය්‍යනති. සො තං රුකඛං මූලතො ඡිනෙදය්‍ය. තං කිමමඤඤසි ගහපති, අසූ යො සො පුරිසො පඨමං රුකඛං ආරුළෙහා, සචෙ සො න ඛිපපමෙව ඔරොහෙය්‍ය තසස සො රුකෙඛා පපතනෙතා හත්ථං වා භඤෙජය්‍ය. අඤඤතරං වා අඞගපචචඞගං භඤෙජය්‍ය, සො තතො නිදානං මරණං වා නිගචෙඡය්‍ය මරණමතතං වා දුකඛනති. එවං භනෙත. එවමෙව ඛො ගහපති අරියසාවකො ඉති පටිසඤචිකඛති: රුකඛඵලූපමා කාමා වුතතා භගවතා බහුදුකඛා බහූපායාසා, ආදීනවො එත්ථ භිය්‍යොති. එවමෙතං යථා භූතං සමමපපඤඤාය දිසවා යායං උපෙකඛා එකතතා එකතතසිතා යත්ථ සබබසො ලොකාමිසූපාදනා අපරිසෙසා නිරුජඣනති. තමෙවුපෙකඛං භාවෙති.

ගෘහපතිය, යම් සේ ගමට හෝ නියම් ගමට හෝ නුදුරු තන්හි තියුණුවූ වනලැහැබක් වේ ද එහි මිහිරි පල ඇත්තා වූ ද හටගත් බොහෝ පල ඇත්තා වූ ද ගසක් වන්නේ ද බිම වැටුනා වූ කිසියම් පල කෙනෙකුත් නොවන්නාහු ද එකල්හි පලයන්ගෙන් ප්‍රයෝජන ඇත්තා වූ පල සොයන්නා වූ පුරුෂයෙක් පල සොයමින් එන්නේ ය. හෙතෙම ඒ වන ලැහැබට ඇතුල්ව මිහිරි පල ඇත්තා වූ හටගත් බොහෝ පල ඇත්තා වූ ඒ ගස දක්නේ ය. ඔහුට මෙබඳු සිතක් වන්නේ ය. “මේ ගස වනාහී මිහිරි පල ඇත්තේ ද හටගත් බොහෝ පල ඇත්තේ ද වෙයි. බිම වැටුනා වූ කිසි පලයකුත් නැත්තේ ය. මම වනාහී ගසට නගින්නට දනිමි. මම මේ ගසට නැග ඇතිතාක් කන්නෙම් නම් ඔඩොක්කුව ද පුරවා ගන්නෙම් නම් ඉතා යෙහෙකැයි” (සිතා) හෙතෙම ඒ ගසට නැඟී ඇතිතාක්ම කන්නේ ය. ඔඩොක්කුව ද පුරවා ගන්නේ ය.

ඉක්බිති පල කැමති වූ පල සොයන්නා වූ දෙවෙනි පුරුෂයෙක් තෙම පල සොයමින් තියුණු වූ කෙටේරියක් ද ගෙන එන්නේ ය. හෙතෙම ඒ වන ලැහැබට ඇතුල්ව මිහිරි පල ඇත්තා වූ ද හටගත් බොහෝ පල ඇත්තා වූ ද ඒ ගස දක්නේ ය. ඔහුට මෙබඳු සිතක් වන්නේ ය. “මේ ගස වනාහී මිහිරි පල ඇත්තේ ද හටගත් බොහෝ පල ඇත්තේ ද වේ. බිම වැටුනා වූ පලයකුත් නැත්තේ ය. මම වනාහී ගසට නගින්නට නොදනිමි. මම මේ ගස මුලින් කපා ඇතිතාක් ද කන්නෙම් නම් ඔඩොක්කුව ද පුරවා ගන්නෙම් නම් ඉතා යෙහෙකැයි” (සිතා) හෙතෙම ඒ ගස මුලින් කපන්නේ ය. ගෘහපතිය, ඒ කුමක් හගින්නෙහි ද? යම් ඒ පුරුෂයෙක් පළමුව ගසට නැගුනේ ද ඉදින් හෙතෙම වහාම නොබසින්නේ නම් ඒ ගස වැටෙන්නේ ඔහුගේ අත හෝ බිඳෙන්නේ ය. අන්‍ය ශරීරාවයවයක් හෝ බිඳෙන්නේ ය. හෙතෙම ඒ හේතුවෙන් මරණය හෝ මරණය සමාන දුකට හෝ පැමිණෙන්නේ ද?”

“ස්වාමීනි, එසේ ය.”

ගෘහපතිය, මෙපරිද්දෙන්ම ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම මෙසේ සලකයි. භාග්‍යවතුන් වහන්සේ විසින් ගසක ගෙඩි වැනි වූ කාමයෝ බොහෝ දුක් ඇත්තාහ. බොහෝ වෙහෙස ඇත්තාහ. මෙහි බොහෝ දෝෂ ඇත්තේ යයි වදරණ ලද්දහ. මෙසේ මෙය ඇතිසැටියෙන් මනා නුවණින් දැක යම් මේ නොයෙක් ස්වභාව ඇත්තා වූ නොයෙක් ස්වභාව ඇසුරු කළා වූ උපේක්ෂාවක් වේ ද එය දුරුකොට යම් මේ එක ස්වභාවය ඇත්තා වූ ඒකත්වය ඇසුරු කළා වූ උපේක්ෂාවක් වේ ද යම් තැනෙක්හි සියලු ආකාරයෙන් පඤ්චකාම ගුණයන් දැඩිකොට ගැනීම ඉතිරි නැතිව නැතිවේ ද ඒ චතුර්ථ ධ්‍යාන උපේක්ෂාවම වඩයි.

ස ඛො සො ගහපති අරියසාවකො ඉමංයෙව අනුත්තරං උපෙක්ඛාසතිපාරිසුද්ධිං ආගම්ම අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතිගයා වීසතිම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාති සතම්පි ජාති සහස්සම්පි ජාති සතසහස්සම්පි අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ අමුත්‍රාසිං එවනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උදපාදිං තත්‍රාපාසිං එවනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නොති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

ගෘහපතිය, ඒ මේ ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම වනාහී මේ උතුම් වූ උපේක්‍ෂා සිහි දෙදෙනාගේ පිරිසිදු වීමටම පැමිණ අනෙක ප්‍රකාර වූ පෙර විසූතැන් සිහිකරයි. එනම් එක ජාතියක් ද ජාති දෙකක් ද ජාති තුනක් ද ජාති සතරක් ද ජාති පසක් ද ජාති දසයක් ද ජාති විස්සක් ද ජාති තිසක් ද ජාති සතලිසක් ද ජාති පණසක් ද ජාති සියයක් ද ජාති දහසක් ද ජාති සියක් දහසක් ද නොයෙක් විනාශ වෙමින් පවතින කල්පයන් ද නොයෙක් හැදෙමින් පවතින කල්පයන් ද නොයෙක් විනාශ වෙන හෝ හැදෙන කල්පයන් ද අසුවල් තැන වීම් මෙනම් ඇත්තෙම්, මේ ගෝත්‍ර ඇත්තෙම්, මේ පාට ඇත්තෙම්, මේ කෑම ඇත්තෙම්, මේ සැපදුක් වින්දෙම්, මේ ආයුෂ කෙලවරකොට ඇත්තෙම්වීම්. ඒ මම එයින් චුතවූයෙම් අසුවල් තැන උපන්නෙමි. එහිදු මෙනම් ඇත්තෙම්, මේ ගෝත්‍ර ඇත්තෙම්, මේ පාට ඇත්තෙම්, මේ කෑම ඇත්තෙම්, මේ සැපදුක් වින්දෙම්, මේ ආයුෂ කෙලවරකොට ඇත්තෙම්වීම්. ඒ මම එයින් චුතවූයෙම් මෙහි උපන්නෙමියි" මෙසේ ආකාර සහිත වූ දැක්වීම් සහිත වූ අනේක ප්‍රකාර වූ පෙර විසූ තැන් සිහිකරයි.

ස ඛො සො ගහපති අරියසාවකො ඉමංයෙව අනුත්තරං උපෙක්ඛාසතිපාරිසුද්ධිං ආගම්ම දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ. හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

ගෘහපතිය, ඒ මේ ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම වනාහී මේ උතුම් වූ උපේක්‍ෂා සිහි පිරිසිදු බවට පැමිණ පිරිසිදු වූ මිනිස් ඇස ඉක්ම පැවැත්තා වූ දිව්‍ය වූ ඇසින් චුතවන්නා වූ ද උපදින්නා වූ ද හීන වූ ද ප්‍රණීත වූ ද සුවර්ණ වූ ද දුර්වර්ණ වූ ද සුගත වූ ද දුර්ගත වූ ද කර්මයට අනුව උපදින සත්වයන් දකී. (කවර ආකාරයෙන් ද යත්: මේ පින්වත් සත්ත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්ත වූහ. වාග් දුශ්චරිතයෙන් යුක්ත වූහ. මනෝ දුශ්චරිතයෙන් යුක්ත වූහ. ආර්‍ය්‍යයන්ට ගරහන්නෝ වූහ. මිථ්‍යා දෘෂ්ටිකයෝ වූහ. මිථ්‍යා දෘෂ්ටිකර්ම සමාදන් වූවෝ වූහ. ඔවුහු මරණින් මතු සැපයෙන් පහවූ නපුරු වූ දුක් වූ නිරයට පැමිණෙත්, නැතහොත් මේ පින්වත් සත්ත්වයෝ කාය සුචරිතයෙන් යුක්ත වූහ. වාග් සුචරිතයෙන් යුක්ත වූහ. මනෝ සුචරිතයෙන් යුක්ත වූහ. ආර්‍ය්‍යයන්ට නොගරහන්නෝ වූහ. සත්‍ය අදහන්නෝ වූහ. සත්‍ය ඇදහීම් සමාදන් වූවෝ වූහ. ඔවුහු මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයට පැමිණියෝ යි. මෙසේ පිරිසිදු වූ මිනිස් ඇස ඉක්ම වූ දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී. මෙසේ පිරිසිදු වූ මනුෂ්‍යත්වය ඉක්ම සිටියා වූ දිව ඇසින් චුතවන්නා වූ ද උපදින්නා වූ ද පහත් වූ ද උසස් වූ ද ලක්‍ෂණ වූ ද අවලක්‍ෂණ වූ ද හොඳ ලොවට ගියා වූ ද නරක ලොවට ගියා වූ ද කම් වූ පරිද්දෙන් පරලොවට ගියා වූ සත්ත්වයන් දැන ගනියි.)

ස ඛො සො ගහපති අරියසාවකො ඉමංයෙව අනුත්තරං උපෙක්ඛාසතිපාරිසුද්ධිං ආගම්ම ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

ගෘහපතිය, ඒ මේ ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම වනාහී මේ උතුම් වූ උපේක්‍ෂා සිහි පිරිසිදු බවට පැමිණ කෙලෙසුන් නැසීමෙන් කෙලෙසුන්ගෙන් වෙන් වූ චිත්ත විමුක්තියට ද ප්‍රඥා විමුක්තියට ද මේ භවයේදී ම තෙමේ ශ්‍රේෂ්ඨ ඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට පැමිණ වාසය කරයි.

එතතාවතා ඛො ගහපති අරියසස විනයෙ සබෙබන සබබං සබබථා සබබං වොහාරසමුචෙඡදො හොති. තං කිමමඤඤසි ගහපති, යථා අරියසස විනයෙ සබෙබන සබබං වොහාරසමුචෙඡදො හොති. අපි නු තවං එවරූපං වොහාරසමුචෙඡදං අතතනි සමනුපසසසීති. කො චාහං භනෙත කො ච අරියසස විනයෙ සබෙබන සබබං සබබථා සබබං වොහාරසමුචෙඡදො. මයං හි භනෙත පුබෙබ අඤඤතිතථියෙ පරිබබාජකෙ අනාජානීයෙව සමානෙ ආජානීයාති අමඤඤිමහ. අනාජානීයෙව සමානෙ ආජානීය-භොජනං භොජිමහ. අනාජානීයෙව සමානෙ ආජානීයටඨානෙ ඨපිමහ. භිකඛූ පන මයං භනෙත ආජානීයෙව සමානෙ අනාජානීයාති අමඤඤිමහ. ආජානීයෙව සමානෙ අනාජානීයභොජනං භොජිමහ. ආජානීයෙව සමානෙ අනාජානීයටඨානෙ ඨපිමහ. ඉදානි පන මයං භනෙත අඤඤතිතථියෙ පරිබබාජකෙ අනාජානීයෙව සමානෙ අනාජානීයාති ජානිසසාම. අනාජානීයෙව සමානෙ අනාජානීය-භොජනං භොජෙසසාම, අනාජානීයෙව සමානෙ අනාජානීයටඨානෙ ඨපෙසසාම භිකඛූ පන මයං භනෙත ආජානීයෙව සමානෙ ආජානීයාති ජානිසසාම ආජානීයෙව සමානෙ ආජානීයභොජනං භොජෙසසාම. ආජානීයෙව සමානෙ ආජානීයටඨානෙ ඨපෙසසාම අජනෙසි වත මෙ භනෙත භගවා සමණෙසු සමණපෙමං සමණෙසු සමණපපසාදං සමණෙසු සමණගාරාවං.

ගෘහපතිය, මෙතෙක් වනාහී ආර්‍ය්‍ය විනයෙහි සර්‍වප්‍රකාරයෙන් සියලු ආකාරයෙන් ව්‍යවහාර-යන්ගේ සිඳීම වේ. ගෘහපතිය, ඒ කුමකැයි හඟින්නෙහි ද? යම්සේ ආර්‍ය්‍ය විනයෙහි සර්‍වප්‍රකාරයෙන් සියලු ආකාරයෙන් ව්‍යවහාර සමුච්ඡේදය වේ ද, කිමෙක් ද නුඹ මෙබඳු වූ ව්‍යවහාර සමුච්ඡේදය තමා කෙරෙහි දක්නෙහි ද?

ස්වාමීනි, මම කවරෙක් ද? ආර්‍ය්‍ය විනයෙහි සර්‍වප්‍රකාරයෙන් සියලු ආකාරයෙන් ව්‍යවහාර සමුච්ඡේදය කවරේ ද? ස්වාමීනි, මම ආර්‍ය්‍ය විනයෙහි සර්‍වප්‍රකාරයෙන් සියලු ආකාරයෙන් ව්‍යවහාර සමුච්ඡේදයෙන් ඈත්වෙමි. ස්වාමීනි, අපි වනාහි පෙර අන්‍ය තීර්‍ථක වූ පරිබ්‍රාජකයන්ව ගිහි ව්‍යවහාර සමුච්ඡේදය නොදන්නවුන්ම දන්නවුන් යයි සැලකුවෙමු. නොදන්නවුන්ටම දන්නවුන් විසින් වැළඳිය යුතු භෝජනය වැළඳවීමු. නොදන්නවුන්වම දන්නවුන්ගේ තන්හී තැබීමු. ස්වාමීනි, අපි වනාහි දන්නාවූම භික්ෂූන් නොදන්නවුන්යයි හඟිමු. දන්නවුන්ටම නොදන්නවුන් විසින් වැළඳිය යුතු භෝජනය වැළඳවීමු. දන්නවුන්ම නොදන්නවුන්ගේ තන්හි තැබීමු.

ස්වාමීනි, දැන් වනාහී අපි අන්‍ය තීර්‍ථක වූ පරිබ්‍රාජකයන් කරුණු නොදන්නවුන්ම නොදන්නවුන් යයි දන්නෙමු. නොදන්නවුන්ටම නොදන්නවුන් විසින් වැළඳිය යුතු භෝජනය වළඳවන්නෙමු. නොදන්නවුන්ම නොදන්නවුන්ගේ තන්හි තබන්නෙමු. ස්වාමීනි, අපි භික්ෂූන් වනාහී කරුණු දන්නවුන්ම දන්නවුන්යයි දැනගන්නෙමු. දන්නවුන්ටම දන්නවුන් විසින් වැළඳිය යුතු භෝජනය වැළඳවන්නෙමු. දන්නවුන්ම දන්නවුන්ගේ තන්හී තබන්නෙමු. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට ඒකාන්තයෙන් ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ ප්‍රේමය, ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ ප්‍රසාදය, ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ ගෞරවය ඉපිදවූහ.

අභිකකනතං භනෙත, අභිකකනතං භනෙත, සෙයයථාපි භනෙත නිකකුජජිතං වා උකකුජෙජයය, පටිචඡනනං වා විවරෙයය, මූළහසස වා මගගං ආචිකෙඛයය, අනධකාරෙ වා තෙලපජෙජාතං ධාරෙයය, චකඛුමනෙතා රූපානි දකඛිනතීති, එවමෙවං භගවතා අනෙකපරියායෙන ධමෙමා පකාසිතො. එසාහං භනෙත භගවනතං සරණං ගචඡාමි. ධමමඤච භිකඛුසඞඝඤච. උපාසකං මං භගවා ධාරෙතු අජජතගෙග පාණුපෙතං සරණං ගතනති.

ස්වාමීනි, ඉතා යහපත. ස්වාමීනි, ඉතා යහපත. ස්වාමීනි, යම්සේ යටිකුරුකොට තබන ලද්දක් උඩුකුරු කරන්නේ හෝ වේ ද වසන ලද්දක් වැසුම් හරින්නේ හෝ වේ ද මංමුළාවූවෙකුට මග කියන්නේ හෝ වේ ද අන්ධකාරයෙහි ඇස් ඇත්තෝ රූප දකිත්වායි තෙල් පහනක් දරන්නේ හෝ වේ ද එපරිද්දෙන්ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්‍මය ප්‍රකාශ කරන ලද්දේ ය. ස්වාමීනි, ඒ මම භාග්‍යවතුන් වහන්සේ සරණකොට යමි. ධර්‍මය ද සංඝයා ද (සරණකොට යමි) භාග්‍යවතුන් වහන්සේ අද පටන් දිවිහිමි කොට සරණ ගියා වූ උපාසකයෙකැයි මා දරණ සේක්වා.